# සමාජ උපභාෂා සහ ප්‍රාස්තාවික භාෂා ස්වරූප අතර පවත්නා වෙනස

එස්. ඒ. සුලක්ෂි තාරිකා, ජේ.එම්.විමංසා හර්ෂණී සහ රෝෂිණී හංසිකා[1]

මානව භාෂාවේ විවිධ ස්වරූපීය විවිධතා දක්නට ලැබේ. ඒසේ විවිධත්වයක් ඇති වී ඇත්තේ විවිධ සමාජ කාර්ය සහ අවශ්‍යතා පදනම් කරගෙන ය. මේ හේතුවෙන් වාග්විද්‍යාත්මක ව භාෂා ස්වරූප වර්ගීකරණයක් කිරීමට හැකියාව ඇත. එක ම භාෂාව වුවත් මෙකී විවිධ අවශ්‍යතා සහ කාර්යවල භාවිත කිරීමේ දී පවත්නා වෙනස්කම් පදනම් කරගෙන වර්ගීකරණයට ලක් කෙරේ. සමාජ උපභාෂා, ප්‍රාදේශික උපභාෂා, ප්‍රාස්තාවික භාෂා ස්වරූප ආදි වශයෙන් භාෂාව වර්ගීකරණයට ලක් වන්නේ මේ හේතුවෙනි. මේ පර්යේෂණ පත්‍රිකාවේ අරමුණ වන්නේ සමාජ උපභාෂා සහ ප්‍රාස්තාවික භාෂා ස්වරූප අතර පවත්නා වෙනස කුමන ආකාරයෙන් පවතින්නේ ද යන්නත් ඒ භාෂා ස්තර දෙක අතර කිනම් සබඳතාවක් පවතින්නේ ද යන්නත් අධ්‍යයනය කිරීම යි. මේ පර්යේෂණය සඳහා දත්ත රැස් කිරීමේ දී වාග්විද්‍යා විෂයය හදාරන සිසු නියැදියක් ඇසුරෙන් දත්ත රැස් කරගනු ලැබූ අතර එමඟින් ප්‍රකට වූයේ සමාජ උපභාෂා සහ ප්‍රාස්තවික භාෂා අතර පවත්නා වෙනස පිළිබඳ පැහැදිලි අවබෝධයක් ඔවුන්ට නොමැති බව යි. සමාජ උපභාෂා හැම විට ම කිසියම් කුඩා හෝ ව්‍යාප්ත වූ සමාජ කණ්ඩායම් අතර ව්‍යවහාර වන අතර එක් සාමාජ උපභාෂාවක් තවත් සමාජ උපභාෂාවක් භාවිත කරන කණ්ඩායමකට අවබෝධ කරගැනීමට අපහසු වේ. ප්‍රාස්තවික භාෂා ස්වරූපවල ස්වභාවය වන්නේ ඒවා ඕනෑ ම සමාජ උපභාෂාවක් භාවිත කරන අයට ද පොදු ව්‍යවහාරයක් වීම සහ නිශ්චිත කාර්ය ක්ෂේත්‍රයකට සීමා වීම යි. මේ අනුව සමාජමය සහ කාර්යමය වශයෙන් සමාජ උපභාෂා සහ ප්‍රාස්තවික භාෂා අතර පැහැදිලි වෙනසක් දක්නට ලැබේ. මෙය බොහෝ දුරට ප්‍රකට වන්නේ වාක්කෝෂයෙනි. වාක්කෝෂයෙහි ඇතැම් වචන සමාජ උපභාෂාවල මෙන් ම ප්‍රාස්තාවික භාෂා ස්වරූපවල ද යෙදෙනු දක්නට ලැබේ. එහෙත් ප්‍රාස්තවික භාෂාවල යෙදෙන වචන ඍජු ව ම ලේඛනයට යොදාගැනේ. සමාජ උපභාෂාවල දක්නට ලැබෙන වාක්කෝෂය ඒ අයුරින් ඍජු ව ම ලේඛනයට යොදාගැනීම දක්නට නො ලැබේ. මේ අනුව මෙකී භාෂා ස්වරූප ද්විත්වය අතර පැහැදිලි වෙනසක් පවතින බව පිළිබිඹු වේ.

**ප්‍රමුඛ පද**: ස්වරූපීය විවිධතා, මානව භාෂාව, සමාජ උපභාෂා, ප්‍රාස්තවික භාෂා, වාක්කෝෂය

[1] වාග්විද්‍යා අධ්‍යයනාංශය